DOI: 10.31357/fhssphd.2013.00085

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ **දර්ශනසූරි** උපාධිය සඳහා

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

නම : පනහඩුවේ යසස්සි හිමි
ශාස්ත්‍රවේදී (විශේෂ) බෞද්ධ ශිෂ්ටාචාරය, ප්‍රථම පන්තිය,
ශ්‍රී ජයවර්ධනපුර, 2008.
ශාස්ත්‍රපති (බෞද්ධ අධ්‍යයන - In English) කැලණිය, 2009.
ශාස්ත්‍රපති, (බෞද්ධ අධ්‍යයන - In English) බෞද්ධ හා පාලි, 2010.

අධ්‍යයනාංශය : පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ලේඛ්‍යාරූඪ අංකය : GS/PhD/BC/1304HU2010001

විෂයය : බෞද්ධ ශිෂ්ටාචාරය

වර්ෂය : 2013 ජුලි
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

**අපේක්ෂකයාගේ ප්‍රකාශය**

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, අභ්‍යන්තර උපදේශක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, පූජ්‍යපාද මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේගේ හා බාහිර පර්යේෂණ උපදේශක, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, එච්. එච්. ඩී. එන්. පී. ඕපාත මැතිතුමාගේ සදුපදේශයෙන්, පුස්තකාල අධ්‍යයනය තුළින් හා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමයෙන් ද දත්ත රැස් කිරීමෙන්, මවිසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබූවකි. මෙය මෙම විශ්වවිද්‍යාලයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නොවන බවත් සහතික කරමි.

මෙයට,



පර්යේෂක,

පනහඩුවේ යසස්සි හිමි

GS/PhD/BC/1304HU2010001

## උපදේශකවරුන්ගේ නිර්දේශය

පනහඩුවේ යසස්සි හිමි විසින් දර්ශනසූරි උපාධි අවශ්‍යතාව සඳහා "**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්**" යන ප්‍රස්තුතය යටතේ ලියා ඇති මෙම නිබන්ධය, දර්ශනසූරි උපාධිය සඳහා උචිත ලෙස සම්පාදනය කර ඇති බවත්, මෙය ඒ සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

01. අභ්‍යන්තර උපදේශක :

............................................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය, මාගම්මන පඤ්ඤානන්ද හිමි

02. බාහිර පර්යේෂණ උපදේශක :

............................................................

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, එච්. එච්. ඩී. එන්. පී. ඕපාත

**Senior Prof. Dr.H.H.D.N.P.Opatha**
BSc(BA)Sp(Hons) (USJ);MSc(BA)HRM(USJ);
MBA(Birmingham);Dip IR&PM (CTC);
Dip Eng (CPM);PhD (HRM)(UUM);
DHRM(IIU);HMIPM (SL);CDBA (OXIM-UK)

**Senior Professor**
Department of Human Resource Management
Faculty of Management Studies and Commerce
University of Sri Jayewardenepura
Nugegoda
Sri Lanka

**අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණන්ගේ නිර්දේශය**

බෞද්ධ ශිෂ්ටාචාරය විෂය යටතේ දර්ශනසූරී උපාධිය සඳහා ලියාපදිංචි අංක GS/PhD/BC/1304HU2010001 යටතේ පනහඩුවේ යසස්සි හිමියන් විසින්, **"ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඵලදායිතාව ඉහළනැංවීමෙහිලා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්"** යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද මෙම ස්වාධීන පර්යේෂණ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරමි.

.......................................

අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණෝ

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

# පිදුම

හෙළා ගත දා බිඳුත්

දරා අත කරගැටත්

ගිරි දුර්ග පසු කෙරූ

පහන් ටැඹ නුඹම විය,

සිවු බඹ ගුණ සිත දැරූ..

මූර්තිය නුඹ නොවෙ ද

උත්තරීතර මවු පදවියේ.....

ගත දරා නේක දුක් කම්කටොලු

රැක ගන්න අප වෙහෙස වී

අකලෙහි ම වෙන්ව ගිය..

පිය කුසුම නුඹම විය,

කළ මහගු මෙහෙවරට

පුදන්නෙමි බැති සිතින්

පියාණෙනි, නුඹ නමට....

මෝහ තිමිරය ඉරා

නිසි මග මට පෙන් වූ,

උතුම් ගුරු දේවයනි......

පා නැමැද පුදමි මම..

කුලුණු සිත් පෙරදැරිව..

## හැකුළුම්

| | |
|---|---|
| ඵලදායිතා සංකල්ප | - ඵලසං |
| ඵලදායිතා වර්ධනය සඳහා අසිරිමත් පංචවිධ සංකල්පය | - ඵලඅසං |
| සංවිධාන චර්යා | - සංචර්යා |
| ඵලදායිතා අවබෝධය හා "එස් පහ" ශිල්පීය ක්‍රමය | - ඵලඅව |
| 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | - ආව්‍යව |
| ආයතන සංග්‍රහය | - ආසං |
| මහා භාණ්ඩාගාරය වාර්ෂික වාර්තාව | - මහාභා |
| ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය | - දණ්ඩසං |
| සිවිල් නීති සංග්‍රහය | - සිවිල්සං |
| ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය කෙරෙහි බලපවත්නා නීතිය | - රාපරිබලනී |
| බුදුදහමේ ආධ්‍යාත්මය | - බුදුආ |
| මජ්ඣිම නිකාය | - මනි |
| සුත්ත නිපාතය | - සුනි |
| අංගුත්තර නිකාය | - අංනි |
| දීඝ නිකාය | - දීනි |
| සුත්ත නිපාතට්ඨකථා | - සුනිඅ |
| ධම්මපදය | - ධප |
| ථෙරගාථා පාළි | - ථෙර |
| සංයුත්ත නිකාය | - සංනි |
| විසුද්ධි මාර්ගය | - විමා |
| සුවිසි මහ ගුණය | - සූමගු |
| සුභාෂිතය | - සුභා |
| ජාතක පාළි | - ජාතක |
| හෙරණසික හා හෙරණසික විනිස | - හෙරණ |
| බෞද්ධ මනෝ විද්‍යාව | - බෞමවි |

| | |
|---|---|
| හත්ථවනගල්ල විහාර වංශය | - හත්ථ |
| චුල්ලවග්ග පාළි | - චුල්ල |
| සමන්තපාසාදිකා | - සපා |
| බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංසකතාව | - බෞශිමූවං |
| මහාවග්ග පාළි | - මහා |
| බෞද්ධ අධ්‍යයන විමර්ශන | - බෞඅවි |
| නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය | - නිසිංශකෝ |
| P.T.S Pali English Dictionary | – PED |
| English Pali Dictionary | – EPD |
| A Pali English Glossary of Buddhist Technical Terms | – PEDBTT |
| සැළලිහිණි සන්දේශය | - සැළසන් |
| ධම්මපදට්ඨකථා | - ධපඅ |
| බුද්ධ චරිතය | - බුච |
| උදාන පාළි | - උදා |
| විනය අධ්‍යයනය | - විඅ |
| පරිවාර පාළි | - පරි |
| විනය පිටකය | - විපි |
| පාරාජික පාළි | - පාරා |
| අපදාන පාළි | - අප |
| Process of Management | - PM |
| සිංහල විශ්වකෝෂය | - සිංවි |
| කළමනාකරණ සංකල්ප බෞද්ධ ප්‍රවේශයක් | - කළසං |
| සිංහල ශබ්දකෝෂය | - සිංශබ් |
| කළමනාකරණ පාරිභාෂික ශබ්දකෝෂය | - කළපාශබ් |
| පාචිත්තිය පාළි | - පාචි |
| සේවාමණ්ඩල කළමනාකරණය I | - සේවා I |

| | |
|---|---|
| සේවාමණ්ඩල කළමනාකරණය II | - සේවා II |
| භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනා | - ප්‍රාතිවර් |
| මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය | - මුල්බුදු |
| මානව සම්පත් කළමනාකරණය හා පුහුණුව | - මාසකපු |
| Personal Quality | - PQ |
| Civil Service Administration in Sri Lanka | - Civil |
| Human Resource Management | - HRM |
| Strategic Human Resource Management | - Str HRM |
| බෞද්ධ සමාජ සංස්ථා අධ්‍යයනය | - බෞසසං |
| මානව සම්පත් කළමනාකරණය | - මාසක |
| බෞද්ධ කළමනාකරණ මූලධර්ම | - බෞකළමූල |
| මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව | - මානසංපු |
| ප්‍රජා පාලන ඉතිහාසය | - ප්‍රජා |
| මධ්‍යකාලීන ලංකා සමාජය | - මධ්‍ය |
| ලංකාවේ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය | - ලංපාආක්‍ර |
| ආණ්ඩුක්‍රමය පිළිබඳව පත්කරන ලද විශේෂ කොමිෂන් සභා වාර්තාව (ඩොනමෝර් වාර්තාව) | - ඩොනමෝර් |
| ආණ්ඩුක්‍රම නීතිය සහ විධායක ජනාධිපති | - ආණ්ඩු |

පරිච්ඡේදකරණය

01. හැඳින්වීම 1-46

1.1 පර්යේෂණ පසුබිම

1.2 ඵලදායිතා සංකල්පය හැඳින්වීම

1.3 ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ආරම්භය හා විකාශය

1.4 රාජ්‍ය ආයතන හා ඒවායෙහි ව්‍යුහය

02. රාජ්‍ය ආයතනවල ඵලදායිතාව නංවාලීමෙහි ලා බලපාන ගැටලු 47-91

2.1 රාජ්‍ය ආයතනවල අතීත හා වර්තමාන ඵලදායිතා මට්ටම

2.2 ඵලදායිතාව නංවාලීමෙහි ලා බලපාන ගැටලු

2.2.1 ඍජුව මිනිසා හා සම්බන්ධ ගැටලු

2.2.2 වක්‍රව මිනිසා හා සම්බන්ධ ගැටලු

2.2.3 වෙනත් ගැටලු

2.3 දැනට භාවිත විසඳුම් උපක්‍රම

2.4 ගැටලු විසඳා ගැනීමෙහි ලා ලබාදිය හැකි විසඳුම් උපක්‍රම

03. බෞද්ධ ඵලදායිතා සංකල්ප 92-283

3.1 කරණීයමත්‍ථධම්ම න්‍යාය

3.2 අන්තර් පුද්ගල සම්බන්ධතා න්‍යාය

3.3 සත්ත "ස" කාර න්‍යාය

3.3.1 සංකප්ප

3.3.2 සංයුඤ්ජන

3.3.3 සංවිධාන

3.3.4 සම්මුති

3.3.5 සුසික්ඛා

3.3.6 සම්භාවනා

3.3.7 සමෙක්ඛණ

**04. ඵලදායිතා වර්ධනය විෂයයෙහි බෞද්ධ කළමනාකරණ සංකල්පයන් හි උපයෝගීතාව** **284-348**

4.1 කළමනාකරණය හැඳින්වීම

4.2 මානව සම්පත් කළමනාකරණය

4.3 බුදුදහමින් නිර්දිෂ්ට භෞතික සම්පත් කළමනාකරණය

4.4 ඵලදායිතා වර්ධනය විෂයයෙහි බෞද්ධ කාල කළමනාකරණය

**05. නිගමන හා නිර්දේශ** **349-357**

**ආශ්‍රිත ග්‍රන්ථ** **358-364**

**පාරිභාෂික වචන මාලාව** **365-368**

**උපග්‍රන්ථය** **369-382**

## පටුන


| | |
|---|---|
| **1. හැඳින්වීම** | **1-46** |
| **1. 1. පර්යේෂණ පසුබිම** | 1 |
| 1. 1. 1. අධ්‍යයනයේ වැදගත්කම | 6 |
| 1. 1. 2. අධ්‍යයනයේ අරමුණු | 7 |
| 1. 1. 2. 1. ප්‍රධාන අරමුණ | 7 |
| 1. 1. 2. 2. සෙසු අරමුණු | 7 |
| 1. 1. 3. පර්යේෂණ ගැටලු | 7 |
| 1. 1. 4. පර්යේෂණ ක්‍රමවේදය | 7 |
| 1. 1. 4. 1. දත්ත රැස් කිරීමේ ක්‍රම | 7 |
| 1. 1. 4. 2. අධ්‍යයනයේ ස්වභාවය | 8 |
| 1. 1. 4. 3. කාල පථය | 8 |
| 1. 1. 4. 4. පර්යේෂකයාගේ මැදිහත්වීම හා සීමා | 9 |
| **1. 2 ඵලදායිතා සංකල්පය හැඳින්වීම** | 9 |
| 1. 2. 1. ඵලදායිතා සංකල්පයේ ඉතිහාසය | 12 |
| 1. 2. 2. කාර්යක්ෂමතාව හා සඵලතාව | 14 |
| 1. 2. 3. ඵලදායිතා සංකල්ප හඳුන්වාදීමට ඇති බාධා | 15 |
| 1. 2. 4. ඵලදායිතා වර්ධනයට සකස් විය යුතු අංශ | 15 |
| 1. 2. 5. වර්තමානයේ ක්‍රියාත්මක ඵලදායිතා සංකල්ප | 17 |
| 1. 2. 5. 1. ධනාත්මක ආකල්ප වර්ධනය | 18 |
| 1. 2. 5. 2. 5S ක්‍රියාත්මක කිරීම | 19 |
| 1. 2. 5. 2. 1. සෙයිරි (තේරීම, සංවිධිත බව) | 20 |
| 1. 2. 5. 2. 2. සෙයිතෝන් (සුපිළිවෙළ) | 21 |
| 1. 2. 5. 2. 3. සෙයිසෝ (සුපිරිසිදුකම) | 21 |
| 1. 2. 5. 2. 4. සෙයිකෙත්සු (සම්මතකරණය) | 22 |
| 1. 2. 5. 2. 5. ෂිත්සුකේ - (ශික්ෂණය) | 23 |

1. 2. 5. 3. යෝජනා ක්‍රම 23

1. 2. 5. 4. තත්ත්ව කව 23

1. 2. 5. 5. නාස්තිය වැළැක්වීම 24

1. 2. 5. 6. Q. C. D. සංකල්පය 24

1. 2. 5. 7. කයිසෙන් ක්‍රියාත්මක කිරීම 25

**1. 3 ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ආරම්භය හා විකාශය** 26

1. 3. 1. රාජ්‍ය සේවාව නිර්වචනය කිරීම 26

1. 3. 2. රාජ්‍ය අංශය 26

1. 3. 3. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ ආරම්භය හා විකාශය 29

1. 3. 4. ශ්‍රී ලාංකිකයන් සිවිල් සේවයට සම්බන්ධ වීම 32

1. 3. 5. සිවිල් සේවය ලංකා පරිපාලන සේවය බවට පත්වීම 34

1. 3. 6. සිවිල් සේවය ලාංකිකකරණය වීම 35

1. 3. 7. රාජ්‍ය සේවය ජනප්‍රිය වීමට බලපෑ හේතු සාධක 36

**1. 4 රාජ්‍ය ආයතන හා ඒවායෙහි ව්‍යූහය** 37

1. 4. 1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 38

1. 4. 2. නාගරික සංවර්ධන අධිකාරිය 40

1. 4. 3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 41

1. 4. 4. ශ්‍රී ලංකා කජු සංස්ථාව 43

1. 4. 5. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 45

**2. රාජ්‍ය ආයතනවල ඵලදායිතාව නංවාලීමෙහි ලා බලපාන ගැටලු** 47-91

**2. 1 රාජ්‍ය ආයතනවල අතීත හා වර්තමාන ඵලදායිතා මට්ටම** 47

2. 1. 1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 47

2. 1. 2. නාගරික සංවර්ධන අධිකාරිය 49

2. 1. 3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 51

2. 1. 4. ශ්‍රී ලංකා කජු සංස්ථාව 52

2. 1. 5. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 54

2. 1. 6. සමස්ත රාජ්‍ය ආයතනවල ඵලදායිතා මට්ටම පිළිබඳ නිගමන 56

2. 2 ඵලදායිතාව නංවාලීමෙහි ලා බලපාන ගැටලු 56

2. 2. 1 ඍජුව මිනිසා හා සම්බන්ධ ගැටලු 57

2. 2. 1. 1. පෞද්ගලික ජීවිතය හා රාජකාරි ජීවිතය අතර අසමතුලිතතාව 58

2. 2. 1. 2. විවාහ ජීවිතය හා සම්බන්ධ ගැටලු 58

2. 2. 1. 3. හිත මිතුරන් හා සම්බන්ධ ගැටලු 59

2. 2. 1. 4. ඥාතීන් හා අසල්වාසීන් සම්බන්ධ ගැටලු 59

2. 2. 1. 5. කාලය කළමනාකරණය කළ නොහැකි වීම 60

2. 2. 1. 6. වෘත්තීය කළමනාකරණය නොමැතිකම 60

2. 2. 1. 7. ආතතිය කළමනාකරණය නො කිරීම 61

2. 2. 1. 8. ධනාත්මක ආකල්ප නැති බව 62

2. 2. 1. 9. ජීවිතය ගැන අනවබෝධය හා අරමුණු නැති බව 62

2. 2. 1. 10. පුද්ගල චරිතය හා සම්බන්ධ ගැටලු 63

2. 2. 2 වක්‍රව මිනිසා හා සම්බන්ධ ගැටලු 64

2. 2. 2. 1. බඳවා ගැනීමේ දුර්වලතා 65

2. 2. 2. 2. අනුස්ථාපනය සම්බන්ධ ගැටලු 69

2. 2. 2. 3. සේවාදායක චලන සම්බන්ධ ගැටලු 70

2. 2. 2. 4. කාර්යඵල ඇගයීම සම්බන්ධ ගැටලු 74

2. 2. 2. 5. විනය පරිපාලනය සම්බන්ධ ගැටලු 75

2. 2. 2. 6. පුහුණුව හා සංවර්ධනය සම්බන්ධ ගැටලු 80

2. 2. 2. 7. වේතන කළමනාකරණ දුර්වලතා 82

2. 2. 2. 8. ඇගයීම සම්බන්ධ දුර්වලතා 83

2. 2. 2. 9. සේවක සුභසාධනය සම්බන්ධ ගැටලු 83

2. 2. 2. 10. සෞඛ්‍ය සම්බන්ධ ගැටලු 85

2. 2. 2. 11. දේශපාලනය සම්බන්ධ ගැටලු (අනවශ්‍ය බලපෑම්) 87

2. 2. 2. 12. වෘත්තීය සමිති කළමනාකරණය සම්බන්ධ ගැටලු 88

**2. 2. 3 වෙනත් ගැටලු** 89

2. 2. 3. 1. වෙළෙඳපොළ පිළිබඳ ගැටලු 89

2. 2. 3. 2. මූල්‍ය කළමනාකරණ අර්බුද 89

2. 2. 3. 3. නිෂ්පාදන කළමනාකරණ ගැටලු 90

2. 2. 3. 4. අලෙවිකරණ ගැටලු 90

2. 2. 3. 5. ස්වාභාවික ගැටලු 90

**2. 3 දැනට භාවිත විසඳුම් උපක්‍රම** 91

**2. 4 ගැටලු විසඳා ගැනීමෙහි ලා ලබාදිය හැකි විසඳුම් උපක්‍රම** 91

**3. බෞද්ධ ඵලදායිතා සංකල්ප** 92-283

**3.1 කරණීයමෙත්තධම්ම න්‍යාය** 93

3. 1. 1. කරණීයමෙත්ත සූත්‍ර නිදානය 93

3. 1. 2. සක්කො ගුණය 95

3. 1. 3. උජු ගුණය 98

3. 1. 4. සුජු ගුණය 101

3. 1. 5. සුවච ගුණය 101

3. 1. 6. මුදු බව 104

3. 1. 7. අනතිමානී බව 106

3. 1. 8. සන්තුස්සකො ගුණය 109

3. 1. 9. සුභර ගුණය 112

3. 1. 10. අප්පකිච්ච ගුණය 113

3. 1. 11. සල්ලහුකවුත්ති ගුණය 116

3. 1. 12. සන්තින්ද්‍රිය ගුණය 120

3. 1. 13. නිපක ගුණය 121

3. 1. 14. කුලේසු අනනුගිද්ධෝ ගුණය 123

**3.2 අන්තර් පුද්ගල සම්බන්ධතා න්‍යාය** 125

3. 2. 1. උපාධ්‍යාය සද්ධිවිහාරික ආචාර්ය අන්තේවාසික වත් 126

3. 2. 2. ෂඩ්දිසා ප්‍රතිච්ඡාදන න්‍යාය 132

3. 2. 2. 1. පුද්ගල ඵලදායිතා වර්ධනය 132

3. 2. 2. 2. ආයතනික ඵලදායිතා වර්ධනය 135

3. 2. 2. 3. සේවකයන්ගේ කාර්යභාරය 140

3. 2. 3. අපරිහානීය ධර්ම පර්යාය 141

3. 2. 3. 1. නිතර රැස්වීම 141

3. 2. 3. 2. සමගි සම්පන්න බව 142

3. 2. 3. 3. නව නීති රීති නො පැනවීම හා පැන වූ නීති රීති කඩ නො කිරීම 142

3. 2. 3. 4. විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගැනීම 143

3. 2. 3. 5. කාන්තා සේවිකාවන්ට රැකවරණය සැලසීම 143

3. 2. 4. ඇවැත් දෙසීමේ න්‍යාය 143

3. 2. 5. උපෝසථකම්ම න්‍යාය 148

3. 2. 6. සාරාණීය ධර්ම න්‍යාය 152

**3. 3 සත්ත "ස" කාර න්‍යාය** 154

**3. 3. 1. සංකප්ප** 154

3. 3. 1. 1. ආකල්පවල වැදගත්කම 156

3. 3. 1. 2. ආකල්ප වෙනස් කිරීම කෙරෙහි ඇති බාධා 156

3. 3. 1. 3. ආකල්ප වෙනස් කිරීමේ ක්‍රම 157

3. 3. 1. 4. ආකල්ප වෙනස් කිරීමේ ප්‍රයෝජන 157

3. 3. 1. 5. ආකල්ප වර්ගීකරණය 158

3. 3. 1. 5. 1. ප්‍රජානන අංශය 158

3. 3. 1. 5. 2. ආවේදනික අංශය 160

3. 3. 1. 5. 2. 1. බාහිර පෞරුෂය 162

3. 3. 1. 5. 2. 2. අභ්‍යන්තරික පෞරුෂය 164

3. 3. 1. 5. 2. 3. ආදර්ශ සම්පන්න බව 167

3. 3. 1. 5. 2. 4. යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී බව 167

3. 3. 1. 5. 2. 5. භාෂා භාවිතය 171

3. 3. 1. 5. 2. 5. 1. අනුපුබ්බී කථා ක්‍රමය 171

3. 3. 1. 5. 2. 5. 2. පටිසාරාණීය කථා ක්‍රමය 172

3. 3. 1. 5. 2. 5. 3. ප්‍රසන්න වචන භාවිතය 173

3. 3. 1. 6. ආකල්ප සකස් කිරීම 175

3. 3. 1. 6. 1. පෞද්ගලික අත්දැකීම් 176

3. 3. 1. 6. 2. සමාජ අත්දැකීම් 177

3. 3. 1. 6. 2. 1. කල්‍යාණ මිත්‍රත්වය 179

3. 3. 1. 6. 2. 2. පාප මිත්‍රත්වය 182

3. 3. 1. 6. 3. අධ්‍යාපනය 186

3. 3. 1. 6. 3. 1. පරිවාස කාලයක් හඳුන්වා දීම 187

3. 3. 1. 7. ධනාත්මක ආකල්ප වර්ධනය 188

3. 3. 1. 7. 1. බුදුදහමේ ධනාත්මක ආකල්ප වර්ධනයේ අනන්‍යතාව 191

**3. 3. 2. සංයුක්ද්ජන** 192

3. 3. 2. 1. අවසානික අරමුණ පැහැදිලි වීම 193

3. 3. 2. 2. අප්‍රමාදී වීම 194

3. 3. 2. 3. උට්ඨාන වීර්යය 195

3. 3. 2. 4. බුද්ධ චරිතයෙන් හෙළිවන සංයුක්ද්ජන ලක්ෂණ 197

3. 3. 2. 4. 1. පවත්තඵලභෝගී වීම 199

3. 3. 2. 4. 2. චතුරංග සමන්නාගත වීර්යය 200

3. 3. 2. 5. අලසකමෙන් තොර වීම 201

3. 3. 2. 6. බාධක ජය ගැනීම 203

3. 3. 2. 7. ඉවසීම 203

**3. 3. 3. සංවිධාන** 204

3. 3. 3. 1. අනවශ්‍ය දේ බැහැර කිරීම 204

3. 3. 3. 1. 1. අනවශ්‍ය භෞතික දෑ ඉවත් කිරීම 205

3. 3. 3. 1. 2. අනවශ්‍ය අභ්‍යන්තරික දෑ ඉවත් කිරීම 206

3. 3. 3. 2. අවශ්‍ය දෑ සංවර්ධනය කිරීම 214

3. 3. 3. 3. පුද්ගලයා හඳුනාගැනීම 216

**3. 3. 4. සම්මුති** 219

3. 3. 4. 1. සංඝකර්ම න්‍යාය 220

3. 3. 4. 2. ඕවාද ප්‍රාතිමෝක්ෂ න්‍යාය 222

3. 3. 4. 3. සාංඝික ක්‍රමය 224

3. 3. 4. 4. ලෝකවජ්ජ හා පණ්ණත්තිවජ්ජ න්‍යාය 225

3. 3. 4. 5. අපරිහාණීය ධර්ම න්‍යාය 226

3. 3. 4. 6. සමගි සම්පන්න බව 227

3. 3. 4. 7. මහාසම්මත සංකල්පය 227

3. 3. 4. 8. බෞද්ධ ඡන්ද ක්‍රමය 229

**3. 3. 5. සුසික්ඛා** 231

3. 3. 5. 1. නීති රීති පැනවීමේ අරමුණු 232

3. 3. 5. 2. ස්වයං ශික්ෂණය 235

3. 3. 5. 3. නීති රීති පැනවීම අත්‍යවශ්‍ය ද? 237

3. 3. 5. 4. ආණා ප්‍රාතිමෝක්ෂය 239

3. 3. 5. 5. දඬුවම් නියම කිරීම 240

3. 3. 5. 5. 1. තජ්ජනීය කර්මය 244

3. 3. 5. 5. 2. නියස්ස කර්මය 245

3. 3. 5. 5. 3. පබ්බාජනීය කර්මය 245

3. 3. 5. 5. 4. පටිසාරාණීය කර්මය 246

3. 3. 5. 5. 5. උක්ඛේපනීය කර්මය 246

3. 3. 5. 5. 6. බ්‍රහ්ම දණ්ඩය 247

3. 3. 5. 5. 7. දඬුවම් ක්‍රමවල ඇති විශේෂතා 247

3. 3. 5. 6. ගැටලු (අර්බුද) නිරාකරණය 248

**3. 3. 6. සම්භාවනා** 257

3. 3. 6. 1. වචනයෙන් ප්‍රකාශ කරමින් හැකියාවන් ඇගයීම 258

3. 3. 6. 2. හැකියාවන් නිහඬ ව සාධුකාර දෙමින් ඇගයීම 259

3. 3. 6. 3. සුවිශේෂී හැකියාවන් සලකා තනතුරු ප්‍රදානය කිරීම 261

3. 3. 6. 4. හැකියාවන් ඇති අය ඇසුරු කිරීමට අන් අයට උපදෙස් දීම 264

3. 3. 6. 5. බ්‍රාහ්මණවාදයෙන් ඈමතීම 265

3. 3. 6. 6. බුදුරජාණන් වහන්සේ නායකයකු ලෙස අන් අයගේ ඇගයීමට ලක්වීම 267

**3. 3. 7. සමෙක්ඛණ** 268

3. 3. 7. 1. අධීක්‍ෂණය කිරීම 269

3. 3. 7. 1. 1. පූර්ව අධීක්‍ෂණය (ආරම්භක අවස්ථාව) 269

3. 3. 7. 1. 1. 1. ආධිපතෙය්‍ය ධර්ම න්‍යාය 269

3. 3. 7. 1. 1. 2. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍ර න්‍යාය 270

3. 3. 7. 1. 2. මුඤ්චන අධීක්‍ෂණය (නික්ඛම අවස්ථාව) 271

3. 3. 7. 1. 2. 1. ස්වයං අධීක්‍ෂණය 272

3. 3. 7. 1. 2. 1. 1. අත්තූපනායික ධර්ම පර්යාය 272

3. 3. 7. 1. 2. 2. අන්‍යයන් විසින් අධීක්‍ෂණය කිරීම 273

3. 3. 7. 1. 2. 2. 1. උපාධ්‍යාය ආචාර්ය තනතුරු පත් කිරීම

3. 3. 7. 1. 2. 2. 2. කාර්යයන් වෙන්කොට අධීක්‍ෂණය කරවීම

3. 3. 7. 1. 2. 2. 3. ප්‍රවීණයන්ට අධීක්‍ෂණ තනතුරු පිරිනැමීම

3. 3. 7. 1. 3. අපර අධීක්‍ෂණය 275

3. 3. 7. 1. 3. 1. ප්‍රගති සමාලෝචනය කිරීම 276

3. 3. 7. 1. 3. 1. 1. පූර්ව සමාලෝචනය 276

3. 3. 7. 1. 3. 1. 2. අපර සමාලෝචනය 277

**4. ඵලදායිතා වර්ධනය විෂයයෙහි බෞද්ධ කළමනාකරණ සංකල්පයන් හි උපයෝගීතාව** 284-348

**4. 1. කළමනාකරණය හැඳින්වීම** 284

**4. 2. මානව සම්පත් කළමනාකරණය** 285

4. 2. 1. මානව සම්පත් අත්පත් කර ගැනීම 287

4. 2. 2. මානව සම්පත් සංවර්ධනය කිරීම 293

4. 2. 3. මානව සම්පත් අභිප්‍රේරණය කිරීම 295

4. 2. 4. මානව සම්පත් සැලසුම් කිරීම 297

4. 2. 5. මානව සම්පත් සංවිධානය කිරීම 298

4. 2. 6. මානව සම්පත් පාලනය කිරීම 303

4. 2. 7. මානව සම්පත් කළමනාකරුවා 307

4. 2. 8. බෞද්ධ මානව සම්පත් කළමනාකරණයේ අනන්‍යතාව 313

**4. 3. බුදුදහමින් නිර්දිෂ්ට භෞතික සම්පත් කළමනාකරණය** 318

4. 3. 1. භෞතික සම්පත් හඳුනාගැනීම 318

4. 3. 2. භෞතික සම්පත් අත්පත්කර ගැනීම 319

4. 3. 3. භෞතික සම්පත් සංරක්ෂණය 320

4. 3. 4. භෞතික පරිසරයේ පිරිසිදු බව 323

4. 3. 5. සෑම උපකරණයකටම නිශ්චිත ස්ථානයක් වෙන් කිරීම 325

4. 3. 6. භෞතික සම්පත් පරිභෝජනය හා බෙදා හැරීම 326

4. 3. 7. පොදු දේපල පරිහරණය හෙවත් සාංඝික ක්‍රමය 330

4. 3. 8. භෞතික සම්පත් සංරක්ෂණ විධි 331

**4. 4. ඵලදායිතා වර්ධනය විෂයයෙහි බෞද්ධ කාල කළමනාකරණය** 333

4. 4. 1. කාල කළමනාකරණය පිළිබඳ නූතන අර්ථකථන 333

4. 4. 2. කාලය කළමනාකරණය කළ හැකිද? 336

4. 4. 3. කාලය පිළිබඳ බෞද්ධාකල්පය 336

4. 4. 4. කාලය වර්ගීකරණය කිරීම 338

4. 4. 5. බෞද්ධ කාල කළමනාකරණයේ පරමාර්ථය 339

4. 4. 6. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන කාල කළමනාකරණ ලක්ෂණ 339

4. 4. 7. බෞද්ධ කාල කළමනාකරණ විධික්‍රම 342

4. 4. 7. 1 භෞතික කාල කළමනාකරණ විධික්‍රම 343

4. 4. 7. 1. 1 කාලය වැය වීමේ දොරටු 343

4. 4. 7. 1.2 කාල කළමනාකරණයට බාධා පමුණුවන අලසකම 344

4. 4. 7. 1. 3 කාල කළමනාකරණය හා වීර්යය 346

4. 4. 7. 2 ආධ්‍යාත්මික කාල කළමනාකරණ විධික්‍රම 347

4. 4. 7. 2. 1 ආයුෂය සීමාසහිත බව සිතීම 347

4. 4. 7. 2. 2 ත්‍රිශික්ෂාව අනුගමනය කිරීම 348

**5. නිගමන හා නිර්දේශ** 349-357

**ආශ්‍රිත ග්‍රන්ථ** 358-364

**පාරිභාෂික වචන මාලාව** 365-368

උපග්‍රන්ථය 369-382

ඇමුණුම් 1

ඇමුණුම් 2

ඇමුණුම් 3

ඇමුණුම් 4

ඇමුණුම් 5

ඇමුණුම් 6

දත්ත ලබා ගැනීමට භාවිත කළ ප්‍රශ්නාවලිය

දත්ත ලබාගත් බව තහවුරු කිරීම

## උපකාරානුස්මෘති

අවුරුදු නවයක් වැනි කුඩා කාලයේ දී මා පැවිදිකොට පීතෘ ස්නේහය ලබා දෙමින් රැක බලාගත් ගුරුදේවෝත්තම අතිපූජ්‍ය **වරායායේ අතුල** නාහිමිපාණන් වහන්සේට, උසස් පෙළ අධ්‍යාපනයේ සිට සියලු පහසුකම් සපයමින් මා රැකබලාගත් ගුරුදේවෝත්තම අතිපූජ්‍ය **තුම්බෝවිල ධම්මරතන** ලොකු හාමුදුරුවන් වහන්සේට, විශ්වවිද්‍යාල ජීවිතයේ දී හමු වූ සුවිශේෂී ගුරුවරයකු මෙන් ම මෙම පර්යේෂණ නිබන්ධයේ අභ්‍යන්තර උපදේශකයන් වහන්සේ ලෙස සදුපදේශයන් ලබා දෙමින් මාගේ දියුණුවේදී අප්‍රමාණ ව සතුටු වෙමින් මා දිරිමත් කරන පාලි හා බෞද්ධ අධ්‍යයනාංශාධිපති ආචාර්ය අතිපූජ්‍ය **මාගම්මන පඤ්ඤානන්ද** හිමිපාණන් වහන්සේට, සරසවි අධ්‍යාපනය ලැබූ කාලයේ දී මෙන් ම දැනටත් ශාස්ත්‍රීය දැනුම ලබා දෙමින් ද විවිධ බාධක මධ්‍යයේ වුව ද විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු වීමට අවැසි මූලික පසුබිම සකසා දෙමින් ද මෙබඳු මාතෘකාවක් තෝරා ගැනීමට මා පෙළඹ වූ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපති මහාචාර්ය අතිපූජ්‍ය **නායිම්බල ධම්මදස්සි** හිමිපාණන් වහන්සේට, සරසවි දිවිය තුළ ශාස්ත්‍රඥානය ලබා දෙමින් දෙපයින් නැගී සිටීමට මග පෙන්වූ **එළමල්දෙණියේ සාරානන්ද, කුඹුකේ චන්දාලෝක** යන ගුරු හිමිවරුන් ඇතුළු එදා මෙදාතුර ශාස්ත්‍රඥානය ලබාදුන් සමස්ත පැවිදි ආචාර්ය මණ්ඩලයට, බෞද්ධ එලදායිතා න්‍යාය සකස් කිරීමේ දී සහයෝගය ලබා දුන් කථිකාචාර්ය ආචාර්ය **මැදගම්පිටියේ විජිතධම්ම** පණ්ඩිත හාමුදුරුවන්ට, සෝදුපත් බැලීමේ දී සහාය දුන් **විතාරන්දෙණියේ චන්දසිරි, උලහිටියාවේ විභාවි, තිහගොඩ සාරද, මුල්ඇඩියාවල අග්ගවංස, කට්ටකඩුවේ චන්දවිමල,** යන හිමිවරුන් ඇතුළු කල්‍යාණ මිත්‍රත්වයටත් පාදාභිවන්දනයෙන් යුක්ත ව පුණ්‍යානුමෝදනා කරමි.

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට තරමක් ඈත් වූ ද ආගන්තුක විෂය ක්ෂේත්‍රයක් වූ ද කළමනාකරණය හා එලදායිතා සංකල්ප සම්බන්ධයෙන් මා දැනුවත් කරමින් බාහිර උපදේශක ලෙස කටයුතු කළ මිනිසුන් අතර විරල සුවිශේෂී ගුණාංගයන්ගෙන් සමන්විත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය **එච්. එච්. ඩී. එන්. පී. ඕපාත** ගුරු පියාණන්ට, අවම වයසක දී දර්ශනසූරී උපාධි සිහිනය සැබෑකර ගැනීමට මග පෙන්වමින් මා දිරිමත් කළ මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ හිටපු සභාපති මහාචාර්ය **ඥානදාස පෙරේරා** ඇදුරුතුමන්ට, ගුරුවරයකු මෙන් ම පියකු මෙන් ද මාගේ ජීවිතයට ආලෝකය සපයමින් ගුරුහරුකම් දෙන බෝසත් ගුණ වඩන මහාචාර්ය

**ජී. ආරියපාල පෙරේරා** ගුරුපියාණන්ට, සරසවියට පැමිණි දා පටන් ම ගුරුහරුකම් ලබා දෙමින් අව්‍යාජ ව ආශීර්වාද කරමින් මාගේ සාර්ථකත්වය සඳහා නොවක් සිතින් ආශීර්වාද කරන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **කේ. ඒ. වීරසේන** ගුරු පියාණන්ට, සරසවි දිවිය තුළ ශාස්ත්‍රඥානය ලබා දෙමින් මා පෝෂණය කළ **යාපාරත්න වීරසේකර, නිමල් වසන්ත මෙන්ඩිස්, ජී. ඒ. ගාමිණී රත්න ශ්‍රී, අනුර ශාන්ත වල්පොල, දුනේෂ් ඉන්ද්‍රරත්න** ආදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගුරුපියවරුන්ටත්, ආරම්භයේ සිට ම කළමනාකරණ විෂය සම්බන්ධයෙන් මා දැනුවත් කළ කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ මහාචාර්ය **හේමන්ත එච්. කෝට්ටවත්ත** ඇදුරුතුමන්ටත්, මෙම මාතෘකාව තෝරා ගැනීමේ දී පටන් මේ දක්වා කල්‍යාණ මිත්‍රත්වයෙන් හා සහෝදරත්වයෙන් බැඳී සිටිමින් මා දිරිමත් කරමින් මග පෙන් වූ කථිකාචාර්ය **එස්. විජිත කුමාර** මහත්මාටත්, පරිගණක අක්ෂර සංයෝජනය කරදුන් **තෙසරණි, චාමිලා, තිළිණි** යන අයටත් **කුමාරි විජේවර්ධන** මහත්මියටත්, දත්ත රැස්කිරීමේ දී හා විශ්ලේෂණය කිරීමේ දී සහාය පළකළ **කුමාරි, අනුරුද්ධ බණ්ඩාර, දිමුතු පුන්සර කොළඹගේ** යන අයටත්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ **තුෂාර** මහාත්මාටත්, තොරතුරු රැස් කිරීමේ දී සහයෝගය දැක් වූ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ඇතුළු සියලු ම රාජ්‍ය ආයතනවල නිලධාරීන්ටත්, **රංග** මහාත්මා ඇතුළු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පුස්තකාල කාර්ය මණ්ඩලයටත්, ආදරණීය **මැණියන්** හා **සහෝදර සහෝදරියන්** ඇතුළු පවුලේ සැමටත් **සුපුන් චන්දිම ගුණසේකර** මහාත්මාටත් පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පළ කරමි.

## සාර සංක්ෂේපය

ලෝකය දිනෙන් දින අතිශය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින බව සුලබ දර්ශනයකි. මහාමාර්ග ඉදිවීම, තට්ටු නිවාස, අහස්කුස සිපගන්නා තරමට උසැති මහාපරිමාණ ගොඩනැගිලි, කර්මාන්ත ශාලා, නිවාස ආදී සෑම ක්ෂේත්‍රයක ම පැහැදිලි සංවර්ධනීය තත්ත්වයක් විද්‍යමාන වේ. එම තත්ත්වය එක් අතකින් දියුණුව ලෙස ද තවත් අතකින් ඵලදායිතා වර්ධනය ලෙස ද ඇතැමෙක් නිර්වචනය කරති. ඒ අනුව වර්තමානය වනවිට ලොවපුරා සාකච්ඡාවට බඳුන් ව ඇති ප්‍රධාන මාතෘකාවක් ලෙස ඵලදායිතා වර්ධනය යන්න හඳුන්වා දිය හැකිය.

ආයතනික අරමුණු සාධනය කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස මෙන්ම ආයතනික සාර්ථකත්වය මැනීමේ ක්‍රමවේදයක් ලෙස ද ඵලදායිතාව හැඳින්විය හැකිය. ජපානය, කොරියාව ආදී ආසියාතික රටවල මෙන් ම බටහිර රාජ්‍යයන්හිත් ඵලදායිතා වර්ධනය සඳහා විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කරනු ලබයි. 5S ක්‍රමය, කයිසෙන්, ධනාත්මක ආකල්ප වර්ධනය, යෝජනා ක්‍රම, තත්ත්ව කව වැනි දෑ වර්තමානයේ බහුල ව භාවිත වන ඵලදායිතා සංකල්ප ලෙස හැඳින්විය හැකිය. ලොව පුරා පොදුවේ භාවිත වන මෙම ක්‍රම ශිල්පයන් ජපානය වැනි රටවල ආයතනවල පමණක් නොව නිවෙස්වල මෙන් ම පාසල්වල ද ක්‍රියාත්මක කරනු දැකගත හැකිය.

ශීඝ්‍රයෙන් වෙනස්වෙමින් පවත්නා ලෝකය තුළ ඵලදායිතා සංකල්පයන් හි ද කිසියම් වෙනස් කිරීම් රැසක් සිදුකළ යුතු කාලය එළඹ තිබේ. අවට පරිසරයේ පිළිවෙළ හා පිරිසිදුකමත් භෞතික සම්පත්වල වැඩිවීමත් ඵලදායිතාව වර්ධනය ලෙස සලකන ඵලදායිතා සංකල්ප වෙනුවට මානව සම්පත් ඵලදායී කරන නව ක්‍රමවේදයක අවශ්‍යතාව මතුවෙමින් පවතී. එයට හේතුව ලෙස දැක්විය හැක්කේ මානව සම්පත් දිනෙන් දින සංඛ්‍යාත්මක ව වැඩි වුව ද ගුණාත්මක වශයෙන් පරිහානියට පත් ව තිබීමයි. භෞතික සම්පත් සංවර්ධනයට වඩා මානව සම්පත තුළ ඵලදායී අදහස් ඇති කොට ආකල්පමය වෙනසක් තුළින් භෞතික සංවර්ධනයක් කරා ගමන් කිරීමේ ක්‍රමවේදයක් බුදුදහම තුළ විද්‍යමාන වේ. බුදුරජාණන් වහන්සේ ආරාමය ඵලදායී ස්ථානයක් බවට පත් කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදයන් ආදර්ශයට

ගනිමින් නූතන ඵලදායිතා සංකල්පවලට වඩා දියුණු, කාලයට හා දේශයට උචිත ඵලදායිතා න්‍යායයක් සූත්‍ර හා විනය පිටකාගත ඉගැන්වීම් ඇසුරින් සකස් කර ගැනීම අසීරු කාර්යයක් නො වේ. මෙම පර්යේෂණයේ දී හඳුන්වා දෙනු ලබන බෞද්ධ ඵලදායිතා න්‍යාය පියවර කිහිපයකින් සමන්විත ය.

- පුද්ගල ඵලදායිතා වර්ධනය.
- අන්තර්පුද්ගල ඵලදායිතා වර්ධනය.
- ආයතනික ඵලදායිතා වර්ධනය.

පුද්ගල ඵලදායිතා වර්ධනය සඳහා කරණීය මෙත්ත සූත්‍රාගත කරුණු 14 ක් කරණීයමත්ථධම්ම න්‍යාය නමින් ද, අන්තර්පුද්ගල ඵලදායිතා වර්ධනය සඳහා සිගාලෝවාද සූත්‍රය මෙන් ම විනය පිටකාගත ආචාර්ය අන්තේවාසික උපාධ්‍යාය සද්ධිවිහාරික වත් ඇසුරින් සැකසුණු අන්තර්පුද්ගල සම්බන්ධතා න්‍යායය ද, ආයතනික ඵලදායිතා වර්ධනය සඳහා සංකප්ප, සංයුඤ්ජන, සංවිධාන, සම්මුති, සුසික්ඛා, සම්භාවනා, සමෙක්ඛණ යන පියවරයන්ගෙන් සමන්විත සත්ත "ස" කාර න්‍යායය ද හඳුන්වාදීම ඵලදායිතාව කෙරෙහි ඉදිරිපත් කෙරන බෞද්ධ න්‍යායයට එළඹුම් වේ. මානව සම්පත ඵලදායී පිරිසක් බවට පත්කොට ඒ මගින් භෞතික සංවර්ධනය කරා යොමු කරවීම මෙම ඵලදායිතා න්‍යායයෙහි පරමාර්ථය යි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඵලදායිතාව වර්ධනය කිරීමෙහි ලා බලපාන ගැටලු හඳුනාගැනීම සම්බන්ධයෙන් කරන ලද නියැදි සමීක්ෂණය තුළින් හඳුනාගත් ගැටලු ඍජු ව මිනිසා හා සම්බන්ධ ගැටලු හා වක්‍ර ව මිනිසා හා සම්බන්ධ ගැටලු වශයෙන් විශ්ලේෂණය කළහැකි අතර එම ගැටලු විසඳීම සඳහා මෙම පර්යේෂණයේ දී හඳුන්වා දෙනු ලබන බෞද්ධ ඵලදායිතා න්‍යාය යොදාගැනීම වඩාත් ඵලදායී වේ.